# Living the Lotus

8
2021
VOL. 191



*Buddhism in Everyday Life*

***Founder's Reflections***

## දුක හා සතුට එක්ව තිබෙන හදවත

සූත්‍ර පොත් විශාල ප්‍රමාණයක් කියවූ පමණින් බුදු දහම හොඳින් අවබෝධ නොවේ. මිනිසුන්ව දහමට රැගෙන, ධර්ම මාර්ගයේ ගමන් කිරීමට මඟ පෙන්වීම තුලිනුයි මුලින්ම බුදු දහම අවබෝධ කරගැනීමට හැකිවන්නේ. මන්ද, මිනිසුන්ගේ හදවත හොඳින් අවබෝධ කර ගැනීමට නොහැකි නම්, බුදුන් වහන්සේගේ මහා මෛත්‍රිය හා දයාව කොපමණ ගැඹුරු දැයි අවබෝධ කර ගැනීමටද නොහැකි වන නිසාය.

සාමාජිකයන් විශාල පිරිසක් භාරව සිටින නායකයන්ද එසේමය. තම වුවමනාවට මේ විදියට කරන්න, අර විදියට කරන්න ලෙසින් පැවසුවත්, තමාට අවශ්‍ය ආකාරයට මිනිසුන්ව හැසිරවීමට නොහැකි වේ.

විටෙක 'මෙය හැමෝටම තෙරුම් කරදෙන්නේ කොහොමද' ලෙසින් දුකටත් කනස්සල්ලටත් පත්වේ. සෑම දෙයක්ම අත්හැරීමට සිතෙන අවස්ථාවද තිබෙන්නට පුළුවන්. මීට එහා කිරීමට තමාට ශක්තියක් නැතැයි ලෙසින් සිතෙන්නටද පුළුවන්. නමුත් ඒ හැම දෙයක්ම තමාගේ දියුණුවක් ඇතිකර දෙන පාසලක පාඩමක් බඳුවේ.

එසේ ඇතිවන හදවතේ අරගල වලින්, අන්‍යයන්ගේ හදවතද ටිකෙන් ටික පෙනෙන්නට ගනියි. ඒ තුලින්, අපි එකිනෙකා නියමාකාරයෙන් දෑස් විවර කර ධර්මය අවබෝධ කරගන්නා තෙක් බලාසිටින බුදුන් වහන්සේගේ මහා මෛත්‍රිය හා දයාවේ ගැඹුරු බව දැනේවි. එම බුදුන් වහන්සේගේ සිතුවිල්ල තේරුම්ගන්නෙ නම්, බුදුන් වහන්සේගේ මහා මෛත්‍රිය හා දයාවේ හදවත තමා තුලට බද්ධ වේ.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 128-129

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 191 (August 2021)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala,
Ruklanthi Palipana, Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international
@kosei-kai.or.jp

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙදා දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙදා ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙදා දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු



*President’s Message*

# හදවතේ හිඩැස පුරවමු

**නිචිකෝ නිවානෝ තුමා**
**ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**

## අපගේ හදවත තුල යක්ෂයෙකු මෙන්ම බුදු කෙනෙකුද වැඩසිටියි

ලෝභය, ද්වේශය, මෝහය මනුෂ්‍යයන්ගේ හදවත කෙලෙසීමට පත්කරන ක්ලේශයන් බව බුදු දහමේදී කියාදෙයි. සෑම දෙයකටම ප්‍රමාණයට වඩා ආශා කිරිම, තෘප්තිමත් බව නොදන්නා හදවත, ධර්මය ගැන අනවබෝධය, පටු සිතුවිලි වලින් යුතු හදවත ආදී තුලින් ඊර්ෂ්‍යාවට, වෛරයට හා ගැටුම් වලට අතවනමින් තමාව දුකට පත් කරන බව පවසයි.

මෙම ත්‍රිවිධ ක්ලේශයන් මනුෂ්‍යයන් වන සෑම කෙනෙකු තුලම පවතිනවා සේම, බුදුන් වහන්සේ තුලද තිබුනි. නමුත් අපි හා බුදුන් වහන්සේ අතර තිබෙන වෙනස නම්, තෘෂ්ණාව හා ක්‍රෝධය සංගමයෙන් යුතුව කොතරම් දුරට පාලනය කල හැකිද යන කරුණයි. අපිට තණ්හාව හා ක්‍රෝධය හොඳින් පාලනය කර ගැනීමට නොහැකි නිසා නොසිතන ආකාරයට ඉක්මන් වී කටයුතු කිරිම හා වැරදී වැඩවල නියැලීමෙන් අනවශ්‍ය කරදර තමා පිට පටවා ගනියි.

එවැනි අවස්ථාවලදී මට 'යකෙක් වැහුනා වගේ' ලෙසින් අපි පවසයි. මෙහි 'යකා' ලෙසින් මිනිසුන්ට හානි කරන හා මනස කැලඹීමට පත්කර ධර්ම පුහුණුවට බාධා කර දේවල් හඳුන්වයි.

මේ දේවල් අපගේ මනස ආක්‍රමණය කිරිමට පිටතින් පැමිණි දේවල් නොවෙයි. දෙවියන් හා බුදුන් තම හදවත තුල වැඩ සිටිනවා හා සමානවම, යක්ෂයන් හා භූතයන් යන සියළුම දෙනා තම හදවතේ ක්‍රියාකාරිත්වය වේ.

වාසනාවට මෙන් සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ 'ධාරණී' නම් 26 වන පරිච්ඡේදයේදී, 'ධාරණී ලබාගෙන තිබෙනවා නම්, ප්‍රේතයන්ට හෝ යක්ෂයන්ට මනුෂ්‍යයන්ගේ දුර්වල ගති සොයාගෙන ඇතුළුවීමට හිඩැසක් ඇති නොකරයි' සේ සඳහන් වේ. තෘෂ්ණාවේ සංකේතය ප්‍රේතයන් වන නිසා, අරකත් ඕනේ, මේකත් ඕනේ ලෙසින් තණ්හාවේ හදවතට පත්වුවත්, ධාරණී ලබාගෙන සිටිනවා නම්, එම හැඟීම ප්‍රචණ්ඩ වීමට පෙර සංගමයෙන් යුතුය පාලනය කර ගැනීමට හැකිබව පවසයි.

අපගේ හදවතේ සිටින යක්ෂයන්ට හා ප්‍රේතයන්ට ප්‍රචණ්ඩ වීමට හිඩැසක් සාද නොදෙන මෙම 'ධරණී' යනු කුමක්ද?. එසේම, මෙම 'ධරණී' ලබා ගැනීමට අපිටත් හැකියාවක් තිබෙනවාද.

## නිරන්තරයෙන් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට උපකාරි වන වදන්

අප සංවිධානයද 'ධරණී' හඳුන්වන්නේ 'කිසිම නපුරක් ඇතිවීමට ඉඩ නොදී, සියළුම යහපත් දේ ලබා ගැනීමට ඇති ශක්තිය' සේම, 'බුද්ධ ලෝකයට සෘජුවම ඇතුළු වීමට හැකි ගුප්ත බලයකින් යුතු වදනක්' වන බවයි. තවත් සරළව පවසනවා නම්, 'ධරණී' සජ්ඣායනය කිරීම තුලින්, හදවත තුල එහා මෙහා දුවන තණ්හාව, ක්‍රෝධය හා ආත්මාර්තකාමී හැඟීම් මැඩපවත්වමින්, තමා තුල තිබෙන බුද්ධ හදවතේ ක්‍රියාකාරිත්වය වැඩි කිරීමට හැකි ශක්තියකින් යුතු මන්ත්‍රයක් වැනි දෙයකි.

ජපානයේ සමුරායිවරුන්ගේ වීරත්වය ගැන සඳහන් 'හගාකුරේ' නම් ග්‍රන්ථයේ, 'අතොමි යෝ ස්වාහ' ලෙසින් වදනක් ඇත. එය 'අමතක වු දෙයක් තිබේද, නැවත වරක් හොඳින් බලන්න' යන අරුත ඇති, තමා කරන දේ ගැන පසුවිපරම් කිරීමට දිරිමත් කරන 'ධරණී' එකකි.

එහි 'ස්වාහ' යනු බුදුන් වහන්සේට අඬ ගසනා වදනක් වනවා මෙන්ම, ඉලක්ක සම්පූර්ණයෙන්ම සපුරා ගනිමු යන අරුථත් ගැබ්වී තිබෙන නිසා, තම හදවත තුල සිටින බුදුන්ට අඬ ගසා, බුද්ධ හදවතට නැවතත් පත්කරන ස්විච්යක් බඳු වේ.

මටත් කේන්ති එනවිට, 'ඕම් සිනාසෙන්න, කෝප නොවන්න... ස්වාහා' ලෙසින් මම හිතින් නිතරම මතුරනවා. එවිට හැඟීම් සන්සුන්ව පාලනය කර ගැනීමට හැකිව, හදිසි වී කිරීමට ගියදේ පිළිබඳව විචක්ෂණශීලීව බැලීමට හැකිවේ.

කොතරම් ශක්තිමත් දැඩි අධිෂ්ටානයකින් යුතු පුද්ගලයෙකුට වුවද, යක්ෂයන් හා ප්‍රේතයන් ලෙස උපමා කරන ලෝභ, ද්වේශ හා මෝහය ජය ගැනීමට නොහැකිය. නමුත්, හදවතේ හිඩැසක් ඇතිවීගෙන එනවිට තමා ගැන පසුවිපරම් කරමින් 'ධරණී' ස්විච්ය දමා, යක්ෂයන් චලනය වීමට ප්‍රථම හිඩැස වසා දමමින්, හදවත වෙනස් කර ගැනීමට හැකිවේ.

එමනිසා අසීරු වදන් වල අරුත හෝ න්‍යායන් නොතේරුනත්, 'ධරණී' සජ්ඣායනය කිරීම තුලින් තම අරමුණු ඉෂ්ඨ කරගත් පුරාණ මිනිසුන් මෙන්ම, අපිවද ඕනෑම වෙලාවක ආධ්‍යාත්මික මාවතට රැගෙන, හොඳින් ගතකිරීමට අවැසි ශක්තිය එහි තිබෙනවා වේ.

එසේනම්, තමා ළඟ තිබෙන 'ධරණී'ය කුමක්ද? ඒ ගැන සිතා අවබෝධයක් ලබා ගැනීම තුලින්, තම හදවතේ හිඩැස පුරවා ගැනීමට එය උපකාරි කරගත හැකිවේ.

From *Kosei*, August 2021.

# මිනිසුන් වෙනුවෙන් වැඩ කරන්න අවශ්‍යයි

නකයමා මසෂි මහතා
තකඔකා ධර්ම ශාඛාව, ජපානය

මෙම සෙප්පෝව, 2021 වර්ශයේ පෙබරවාරි මස කෝසෙයි සඟරාවේ (කෝසෙයි ප්‍රකාශකයන්) පලකල 'බුදු දහම තුලින් ලැබූ අත්දැකීම් තුලින් අලුත් ජීවිතයක්' යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද්දකි.

මම රෙදිපිළි නිෂ්පාදන සමාගමක අලෙවි නියෝජිතයෙකු ලෙස වසර 26 ක පමණ කාලයක් සේවය කලා. ඉන් පසු මම රෙදිපිළි නිෂ්පාදන හා අලෙවි කිරීමේ සමාගමක් ආරම්භ කර දැනට වසර 18 ක් ගතවනවා. එසේ බලන විට මම මේ වෘත්තීයේ නියලී වසර 44 ක් ගත වනවා.

මම කලින් රැකියාව කල සමාගමේ නූල්, ගාන්චු, බොත්තම් වැනි රෙදිපිළි ආයිත්තම්, ඇඳුම් නිෂ්පාදනය සඳහා තොග ලෙස ලබාදෙන, සේවකයන් 15 දෙනෙකු පමණ සේවය කරන කුඩා සමාගමක්. සමාගම තුල එකිනෙකා සමග සහයෝගයෙන් විනෝදයෙන් කටයුතු කරමින් සිටියා.

රැකියාව කරමින් වසර 17 ක් ගෙවී ගිය තැන මට වයස 41 දී, මම සේවකයන් සහ සැපයුම් කරුවන් අධීක්ෂණය කරන කළමණාකාර තනතුරට පත් වුනා. එම කාලයේ, මාගේ බිරිද මෙගුමිත්සුකෝ ගේ මාර්ගයෙන් රිෂ්ෂෝ කෝසෙයිකායි තකඔකා ධර්ම ශාඛාවේ ජේෂ්ඨ කණ්ඩායමේ ක්‍රියාකාරකම් වලට සහභාගි වුනා. එදිනෙදා ජීවිතයේ අපිට එන ප්‍රශ්ණ ගැටළු වලට බුදුන් වහන්සේගේ ධර්මය තුළින් පිළිතුරු ලැබෙන හෝසා, සාමාජිකයන්ගේ නිවෙස් වලට තෙදොරි යමින් ධර්මයට අනුකූලව ජීවත් වන ආකාරය ඉගෙන ගනිමින්, ඉතාම කරුණාවන්තව සාමාජිකයන්ගේ දුකට සාවදානව සවන්දෙන ජේෂ්ඨ සාමාජිකයන් දෙස බලා ඉගෙනගනිමින්, මම සේවකයන් සමග හැසිරිය යුතු ආකාරය ඉගෙන ගත්තා.

ඒ කාලයේම ජපානයේ ඇතිවූ ආර්ථික අවපාතය නිසා සමාගමේ සැපයුම් කරුවන්ද බංකොලොත් වී, සමාගමට ලැබෙන ඇණවුම් ප්‍රමාණයද ටික ටික අඩු වුනා.

ව්‍යාපාරය නරක අතට හැරුණු නිසා, යහපත් ලෙස කටයුතු කල ප්‍රධානීතුමාගේ හැසිරීම වෙනස් වුනා. ඔහු සේවකයන් සමග කතාබහ කරන්නේ නැතිව, කියන්නට අවශ්‍යදේ කොලයක ලියා දන්වමින්, සේවකයන් සමග කතාබහ කිරීම සහ සබදතාවය නවතා දැමුවා. ඒ වාගේම ප්‍රධානීතුමා සේවකයෙකු වරදක් කල විට ඔවුන්ට දරුණු ලෙස බැණ වදිමින්, ඔවුන් කොපමණ හොඳින් වැඩ කලත් කිසිම හොඳක් නොකියමින් කටයුතු කලා. අපිටත් ප්‍රධානීතුමා ගැන තිබූ කැමැත්ත, විශ්වාසය නැතිව ගොස් රැකියාව කිරීම මහත් හිසරදයක් වුනා.

මෙවන් වාතාවරණයක් තිබෙන කාලයේ මම ධර්ම ශාඛාවේදී සවස පැවැත්වූ ජේෂ්ඨයන්ගේ හෝසාවකට සහභාගී වී, නුමද යුෂි කියොකයිචෝසාන්ට (වර්තමානයේ ධර්ම උපදේශක) මාගේ වැඩපලේ ප්‍රශ්ණය පැවසුවා. එවිට නුමද කියොකයිචෝසාන් 'නකයමා සාන්, මාගේ කාමරය මල් වලින් පිරිලා තිබෙනවා. මම සෑම දිනකම උදෑසන සුභ උදෑසනක් වේවා යැයි මල් වලට ආචාර කරත් කිසිම දිනක මල් මට ප්‍රතිඋත්තර ලබාදුන්නේ නැහැ. හදවතින්ම තාමා මූලිකත්වය ගෙන කටයුතු කිරීමයි වැදගත්. සෑම දෙයක්ම පිළිවෙලකට කොලයක ලියා සේවකයන්ට ලබාදෙන ඔබගේ ප්‍රධානීතුමා වගේ කාරුණික ප්‍රධානීන් සෑම තැනම නැහැ. පුද්ගලයන්ට විවිධ ප්‍රශ්ණ ගැටළු තිබෙනවා. නකයමා සාන්ට ප්‍රධානීතුමා සහ සේවකයන් අතර හොඳ සම්බන්ධතාවක් ගොඩනැගීමේ වැදගත් රාජකාරියක් පැවරිලා තිබෙනනවා නොවේද?' යැයි මට උපදෙස් ලබා දුන්නා.

එම උපදෙස් මට විශාල කම්පනයක් ගෙන දුන්නා. මමත් අනෙක් සේවකයන් වාගේම, ව්‍යාපාරය බිද වැටීම, සේවකයන්ගේ සමගිය සතුට නැතිවීම යන සෑම දෙයක්ම වුනේ ප්‍රධානීතුමාගේ වරදින් යැයි සිතා ඔහුට දොස් පරොස් කියමින් සිටියා. 'ප්‍රධානීතුමාට කරුණාවන්තව සළකමින්



'හොකුරිකු රැස්වීමේ දී' තකඔකා ධර්ම ශාඛාව භාරව කටයුතු කරන නකයමා සාන්.

ගෞරව කරමින් කටයුතු කරන්න' යැයි නුමද කියොකයිචෝසාන් ගෙන් මට උපදෙස් ලැබුනා.

පසු දිනයේ සිටම මම, ප්‍රධානීතුමාට ප්‍රබෝධමත් හදවතින් 'සුභ උදෑසනක් වේවා' යැයි ආචාර කලා. නමුත් ප්‍රධානී තුමාගෙන් ඊට ප්‍රතිචාරයක් නොලැබුනත් හදවතින්ම සුභ ප්‍රාර්ථනා කර ආචාර කිරීමට හැකි වීම ගැන මට මහත් සතුටක් දැනුනා.

එසේම මම ප්‍රධානී තුමා දෙස බලන ආකරය වෙනස් කල විට, ඔහු කාටත් වඩා උදෑසනින්ම පැමිණ පිරිසිදු කටයුතු කරන ආකාරය මගේ මතකයට නැගුනා. සේවකයන්ට හොඳ හැඟීමකින් යුතුව වැඩකිරීම සඳහා කාටවත් නොකියා නිහඩව සිදු කරනා සේවය මට අවබෝධවුනා.

මමත් ප්‍රධානීතුමන් සමග උදෑසනම වැඩපලට පැමිණ පිරිසිදු කටයුතු කිරීමට පටන් ගත්තා. එසේ කල විට, 'නකයමා සාන් බොහොම ස්තූතියි' යැයි ප්‍රධානීතුමා මට ස්තූතිකලා. ප්‍රධානීතුමා අතර තිබෙන පරතරය ටිකෙන් ටික අඩුවී නැවතත් කලින් තිබූ ආකාරයටම සම්බන්ධතාවය ගොඩනැගෙන බව මට දැනුනා. මම සෑම දිනකම උදෑසන රැස්වීමේදී ප්‍රධානී තුමා උදේම පැමිණ පිරිසිදු කටයුතු කිරීම පිළිබඳ මාගේ ස්තූතිය ප්‍රකාශ කලා. මම එසේ කලේ සේවකයන් සහ ප්‍රධානීතුමන් අතර හොඳ සබඳතාවක් ගොඩනැගීම මාගේ වගකීමක් යැයි නුමද කියොකයිචෝ සාන්ගෙන් මට ලැබුනු උපදෙස සිහියට නැගී එය ක්‍රියාවට නැංවීමට ලැබුනු සුදුසු අවස්ථාවක් යැයි සිතුන නිසාවෙනි. සැර පරුෂ ප්‍රධානීතුමා සේවකයන් වන අපි ගැන සිතා උදේම ඇවිත් පිරිසිදු කිරීම් කරනවා යන්න ඇසූ විට සේවකයන් පුදුමයට පත් වුනා.

ධර්ම ශාඛාවේ ජ්‍යේෂ්ඨ කණ්ඩායම් ක්‍රියාකාරම් වලදී තමා වෙනස් වූ විට අන් අයද වෙනස් වන බව ඉගෙන ගත්තද, ප්‍රධානීතුමා සහ සේවකයන්ගේ වෙනස් වීම හැබැහින් අත්විද ධර්මයේ සත්‍යතාවය මාගේ හදවතට දැනුනා.

ඉන්පසු ආයතනයේ තිබූ ගැටුම්කාරී තත්වය නැතිව ගොස් සාමකාමී බවට පත් වුනත්, ආයතනයේ අර්බුද තත්වය එන්න එන්නම වැඩි වුනා.

2002 වර්ශයේ සැප්තැම්බර් මාසයේ එක් දිනක් උදෑසන වෙනද වගේම රැකියාවට යන විට කාර්‍යාලයේ ඇතුල් වෙන තැන මොනවද ලියූ කොලයක් අලවා තිබුනා. එහි ආයතනයේ බංකොලොත් වීම ගැන ලියා තිබුනා. මම මේ අවස්ථාවට මුහුණදීමට සූදානම්ව සිටියත් හදිසියේම සිදුවූ මේ සිදුවීම නිසා, ව්‍යාපර හවුල් කරුවන් විසින් 'මට ඔබලාගේ ප්‍රධානී සමග කතා කරන්න ඕනා' යැයි මාගේ දුරකථනයට පණිවිඩ පැමිණියා.

අපගේ ආයතනය බංකොලොත් වීම ගැන ඔවුන් කණගාටුව ප්‍රකාශ කලත්, මම මිට වඩා ණය හිමියන්ට සහ ගැනුම් කරුවන්ගෙන් සමාව ගැනීම කලයුතු යැයි තීරණය කලා. එය අලෙවි කළමණාකරුවෙකු ලෙස මාගේ රාජකාරියක් බව මට සිතුනා. එදින සවස ධර්ම ශඛාවට ගොස් මාගේ අදහස නුමද කියොකයිචෝසාන්ට පැවසූවිට, 'ඔබ අවංකව ඒ මාර්ගයේ ගමන් කරන්න' යැයි මාව දිරිමත් කලා. 'යහපත් දේ ඉක්මනින් ක්‍රියාවට නංවන්න' යැයි කියමනක් තිබේ. මම එම හැඟීමෙන් තෝයමා ප්‍රදේශය තුල සිටින ගැනුම් කරුවන් 300 දෙනාව හමුවීමට ගියා.

'ඔවුන් වෙත ගොස්, අපගෙන් වුන අපහසුතාවයට සමාවෙන්න.' යැයි හිස නමා සමාව අයැද සිටියා. ඒ සමගම ඔවුන්ට සිදු වූ අපහසුතාවය ගැනද විමසා බැලුවා. 'අපගේ නිෂ්පාද නොලැබුනහොත් මහත් අපහසුතාවකට පත්වන බව' ඔවුන් පැවසූ දේ අසා එම ප්‍රදේශය තුල තිබෙන වෙනත් සමාගමකින් ඔවුන්ට එම නිෂ්පාදන ලබාදීමට කටයුතු කලා. ඉන් පසු ඔවුන්ගෙන් පමිණිලි නොපැමිණියත්, ඒ වෙනුවට මාගේ ඉදිරිය ගැන සිතමින් මා ගැන කණගාටුවන කිහිපදෙනෙක් සිටියා. ඔවුන් අතරින් කිහිපදෙනෙක් 'ඔබ අළුත් සමාගමක් පටන් ගත්තානම්



නිෂ්පාදිත ඇඳ ඇතිරිලි ගෙන එන නකයමා සාන්.

හොදයිනෙ' යැයි පවසමින්, මූල්‍යමය වශයෙනුත් උදව් කරන්නම් යැයි කියා සිටියා. එයින් මාගේ හදවත තුල ඔවුන් පිළිබඳ මහත් ස්තූතිවන්ත හැඟීමක් ඇතිවුනා.

ආපසු හැරී බැලූ විට පසුගිය වසර කිහිපය තුල මම අලෙවි කළමණාකාර යන තනතුර තුල සිරවී කටයුතු කලා. බුදු දහම තුල අන් අයගේ සතුට වෙනුවෙන් කටයුතු කරන්න යැයි 'සය පාරමිථා' ගැන ඉගැන්වූවත්, මම ඊට හාත්පසුන්ම වෙනස් ලෙස කටයුතු කලා.

මගේ වගකීම නිශ්පාදන විකිණීම පමණයි යැයි සිතීම නිසා පාරිබෝගිකයන්ව වැදගත්කොට සැළකීම මට අමතකව තිබුනා. මමත් අනිත් සේවකයන් වාගේම සමාගමේ බංකොලොත් බාවයට ප්‍රධානීතුමාට බැණවදිමින් කටයුතු කලා. මම සමාගමේ බංකොලොත්වීමත්, ඉන්පසු සහභාගි වූ වන්දනා ගමන තුලින් බුදුන් වහන්සේ පෙන්වාදුන් ආකාරයට ජීවිතය හරි ආකාරව වෙනස කර ගනිමින්, හරි ආකාරව රැකියාවේ නිරතවන ආකාරයත් බුදුන් වහන්සේ මට කියා දුන්නා යැයි මට සිතෙනවා.

මාසයක පමන වන්දනා චාරිකාව අවසන් වන විට මාගේ හදවත තුල එක් අදහසක් පැලපදියම්ව තිබුනා. එම අදහස නම්, 'මා ගැන සිතමින් මට මූල්‍යමය වශයෙන්ද සහයෝගය දක්වන්නම් යැයි පැවසූ අයට මම පිලිතුරු දෙන්න ඕනා' යන අදහසයි. එම අදහස මට මගේම සමාගමක් ගොඩනැගීමට රුකුලක් වුනා. මම මේ අදහස නුමදූ කියොකයිචෝසාන්ට පවසා, නව සමාගමක් පටන් ගැනීමට අවශ්‍ය මූල්‍යමය කටයුතු, කාර්‍යාලයට අවශ්‍ය දේ ගැන උපදෙස් ලබා ගත්තා.

කලින් රැකියා ස්ථානයේ නූල්, බොත්තම් භාරව සිටි නිසා, දැන හඳුනාගත් තොග වෙළෙන්දෙකුගෙන් තොග ඇනවුම් කලා. මුලින් මුදල් ලබාදීමට නොහැකි නිසා තොග ලබා දීම ඔවුන් ප්‍රතික්ෂේප කලත්, ස්තූතිවන්ත කාරනය නම්, කනසවා නගරයේ සමාගමක් සම්බන්ධකර දුන් නිසා, ඔවුන්ගෙන් අපට අවශ්‍ය නිෂ්පාදන ද්‍රව්‍ය තොග තනි පුදගල ව්‍යාපාර කරුවෙකු ලෙස ගිවිසුමක් තුලින් ලබා ගැනීමට හැකි වුනා.

මිලදී ගත් නිශ්පාදන ද්‍රව්‍ය ගබඩා කිරීමට ගබඩාවක් සහ වැඩ කිරීමට කාර්යාලයක් ගැනුම්කරුවෙක් වන සමාගමක ප්‍රධානී කෙනෙක්, 'නකයමා සාන්, වැඩ කිරීමට සහ ගබඩා කිරීමට අපේ ගබඩාව පාවිච්චි කරන්න' යැයි පැවසීම මට මහත් ස්තූතිවන්ත සහ සතුටුදයක කාරණාවක් වුනා. මේ ආකාරයට නව සමාගම ආරම්භය සඳහා අඩිතාලම වැටුනා.

කලින් ආයතනයේ බංකොලොත් වීමෙන් මාස 2 කට පසු, මම තනි පුදගල ව්‍යාපාර කරුවෙකු ලෙස නූල්, බොත්තම් වැනි ද්‍රව්‍ය, ඇදුම් ආයිත්තම් තොග, රෝහල් වලට අවශ්‍ය කොට්ට උර, ජලය උරා නොගන්නා ඇද ඇතිරිලි, හෝටල් වල භාවිතා කරන තුවා ආදිය විකිණීම ආරම්භකලා. මෙවර මම, 'හැකිතාක් ගැනුම් කරුවන් සමග හොඳ සබදතාවයකින් කටයුතු කිරීම' 'නියමිත දිනයට බඩු ලබාදීම' යන කරුණු දෙක සෑම විටම පිළිපැදීමට කටයුතු කලා.

ගැනුම් කරුවන් සමග ව්‍යාපාරය ගැන කතා කිරීම පමනක් නොව, ඔවුන් සමග ආගිය තොරතුරු කතා කරමින්, ඔවුන් සමග ප්‍රශ්ණ ගැටලු සාකච්චා කරමින් හොද සම්බන්ධතාවයකින් කටයුතු කරමින් සිටිනවා. 'පරන මහන මැෂිම කැඩුනා' යන්න අසන්නට ලැබුන විට මැෂින් අලුත් වැඩියා කරන තැන් සොයමින්, 'නකයමා සාන් ළමා ඇදුම් මහන්නේ නැතිද' යැයි ඇසූ විට ළමා ඇදුම් මහන ස්ථාන ඔවුන්ට හදුන්වාදෙමින් කටයුතු කරමින් සිටිනවා.

ඒ වාගෙම විදුලි බුබුලු ප්‍රතිසංස්කරනය, කාර්යාල සකස් කිරීම වැනිදේද සිදුකරන නිසා, ගැනුම් කරුවන් අපිට ස්තූතිවන්තව එයින් නොනැවතී අපිට නව ගැණුම් කරුවන්ද හදුන්වා දෙනවා. මම මේ තුළින් මිනිසුන් සමග හොද සම්බන්ධතාවයක් පවත්වා ගැනීමේ වැදගත්කම අත්වින්දා.

ව්‍යාපාරය හොදින් කරගෙන යනවිට 2018 වසරේ 12 වන මස 'කළමණාකරුවෙකු විය යුත්තේ කෙසේද, වැඩ කලයුත්තේ කුමන ආකාරයටද' යන්න පැහැදිලි මාර්ගෝපදේශයක් ලබා ගැනීමට අවස්ථාව හිමි වුනා. එනම්, ප්‍රථම වරට කෝසෙයිකායි මූලස්ථානයේ දයිසේදෝවේ පැවැත්වූ, 'බුදු දහම තුලින් ව්‍යාපාර කළමණාකරනය' යන වැඩසටහන තුලිනි.

'අනාගතය වෙනස් කරමු' යන මාතෘකාව යටතේ ව්‍යාපාර කළමණාකරනය සම්බන්ධව කටයුතු කරන සාමාජිකයන් රටේ සෑම තැනකින්ම රැස්ව තිබුනා. එහිදී මූල්‍යමය අර්බුධ වල සිටින අයගේ අත්දැකීම් සහ කණ්ඩායම් ක්‍රියාකරකම් තුලින් ව්‍යාපාර කළමණාකරනය පිළිබද රහස් ඉගෙන ගැණීමට හැකි වුනා.

මම සාමාන්‍ය රැස්වීමකට සහභාගි වන පරිදි සහභාගි වුනත්, 'බුදු දහම ඉගෙන ගනිමින් සමාජයට උදව් කරමු' යන්න සහභාගිව සිටි සියල්ලන්ගේ හැගීම වුනා, එතුලින් මගේ දෑස්ද විවර වන්නට වුනා. මෙතෙක් කල්, 'රැකියාව තුලින් මිනිසුන්ට උපකාර කරන්න ඕනා' යැයි සිතා

සිටියත්, සය පාරමිථා තුල තිබෙන 'දනය' යන්න ප්‍රායෝගිකව සිදුකිරීම වැදගත් බව අවබෝධ කරගත්තා. එවිට, කලක සිට මගේ හිතේ තිබූ නික්යෝ නිවානෝ තුමාගේ 'අවංකව සහ කරුණාවන්තව කටයුතු කරනවානම් මිනිසුන් අපව පිළිගන්නවා'. එම නිසා අවංකව සහ කරුණිකව 'දනය' දීමේ වැදගත්කම අවබෝධකරගත්තා.

ඉගෙනගත් දේ ක්‍රියාවට නංවමින්, 'අතපසු නොකර උදේ සවස සූත්‍ර සජ්ජායනා කරමින්' 'සය පාරමිතා පුරුදු පුහුණුව විශේෂයෙන් දනය දීම' 'කළමණාකරුවෙකු ලෙස ආත්මාර්ථකාමීත්වය යටපත් කරගෙන අන් අයගේ හදවත තේරුම් ගෙන කටයුතු කිරීම' යන කරුණු 3 පිළිපදිමින් කටයුතු කිරීමට මම සිතා ගත්තා. එසේ කලවිට, සූත්‍ර සජ්ජායනය තුලින් හදවත තැන්පත් වී, 'දනය' දීම ක්‍රියාවට නගමින් කටයුතු කරන විට ගැනුම් කරුවන් සමග අවංකව කටයුතු කිරීමට හැකියාව ලැබී තිබෙනවා.

කොරෝනා වසංගත ව්‍යාප්තිය නිසා රැකියාවේ වැඩ ටිකක් අඩු වුනත්, නව ගැනුම් කරුවන්ගෙන් ඇනවුම් ලැබෙමින් තිබෙනවා.

මට දැනෙන දෙයක් නම් මේ ව්‍යාපාරය මම තනිව ගොඩනගපු දෙයක් නොවේ යන්නයි. රෙදිපිළි ද්‍රව්‍ය මිළදී ගන්නා අය, රෝහල් වලට රැගෙන යන ඇද ඇතිරිලි වැනි ඇදුම් නිෂ්පාදනය කරන අය, ඇදුම් ආයිත්තම් මිළදී ගෙන භාවිතා කරන අය, වැනි සෑම කෙනෙකුගේම උදව් උපකාරයෙන් මට මේ ආයතනය පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබෙනවා යැයි මම සිතනවා.

මින් ඉදිරියටත්, 'සියළු දෙනා වෙනුවෙන්' හදවත සංවර්ධනය කර ගනිමින් බෝධිසත්ව චර්‍යාවේ යෙදීමට බලාපොරොත්තු වනවා.

බොහොම ස්තූතියි.



# රිෂ්ෂෝ කෝසෙයි කායි හැදින්වීම

මෙම මාසයේ සිට නික්යෝ නිවානෝ නිර්මාතෘ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය පිළිබඳව ඉතා පැහැදිලිව මෙම කාටූනය කියා දෙන්නෙමු.

## නික්යෝ නිවානෝ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය.

### නිර්මාතෘ තුමා, මොනවගේ පුද්ගලයෙක්ද?

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය පිහිටවූයේ, නික්යෝ නිවානෝ තුමාය. 'නිර්මාතෘ තුමා' ලෙස සැමගෙන් ආමන්ත්‍රණය ලැබූ එතුමා, නිතරම සිනාමුසු මුහුණින් සාමාජිකයින් සමග කතාබහ කල අතරම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පහසුවෙන්ම තේරුම් ගතහැකි ආකාරයට පැහැදිලි කර දුන්නා.

1906 අවුරුද්දේ, නීගතා පලාතෙ තෝකමචි නගරයේ සුගනුමා පුන්චි ගමේ නිවානෝ තුමා උපත ලැබුවා. ප්‍රාථමික පාසල් අධ්‍යාපනය අවසන් කල විගස රැකියාවක් කිරීම සඳහා තෝකියෝවට පැමිණි එතුමා, මහන්සිවී වැඩකරන ගමන්ම, අන් අයව දුකින් මුදවා ගතයුතුයි යන අරමුණින්, විවිධ ආගමික විශ්වාසයන්ගෙන් අද්දැකීම් ලබා ගත්තා.

ඒ අතර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය කියවා පැහැදීමට පත්ව 'සියලුම දෙනා දුකින් මුදවා ගතහැකි ඉගැන්වීමක්' යැයි වටහා ගත් නිර්මාතෘ තුමා, 1938 දී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පාදක කරගෙන රිෂ්ෂෝ කෝසේයි කායි සංවිධානය පිහිටවනු ලැබුවා.


එතැන් සිට නිර්මාතෘ තුමා විශාල පිරිසකට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් කියාදී සතුට සඳහා මගපෙන්වූවා. එතැනින් නොනැවතුනු නිවානෝ තුමා, ජාතික මට්ටමින් සුහදතාවය ඇතිකිරීමේ අරමුණින් 'දීප්තිමත් සමාජයක් ගොඩනැගීමේ ක්‍රියාකාරකම්' කල අතර, ලෝක සාමය උදා කරගැනීම වෙනුවෙන් විවිධ ආගමික නායකයින්ට ආරාධනා කර, ආගමික නායකයින් අතර සුහද හමුවීම් පැවැත්විය.



※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# සීයාගෙන් ඉගෙනගත් දේ




කුඩා කාලයේ 'ෂිකසෝ' නමින් හැමෝම ආදරයෙන් කතා කල නිර්මාතෘ තුමා නිතරම සීයා සමග කාලය ගත කලා. හැමදම දුවල පැනල සෙල්ලම් කරන නිර්මතෘ තුමාව සීයා නිතරම ආරක්ෂා කලා.

ශීත ඍතුවේ දී හිම සෙල්ලම් කර, සීතල වී පැමිණෙන නිර්මාතෘ තුමාව තුරුලට ගෙන උණුසුම ලබාදෙන ගමන්ම 'අන් අයට උදවු කරන පුද්ගලයකු' වන ලෙසට සීයා අවවාද කලා.

''මම බුද්ධ මාර්ගයේ ගමන් කරන පුද්ගලයකු වීමට ප්‍රධානතම හේතුව වන්නේ මගේ සීයාගේ ඉගැන්වීම්'' කියා නිර්මාතෘ තුමා පවසා තිබෙනවා.

**ඔබේ දැනුමට**

නික්යෝ නිවානෝ තුමාගේ සීයා, හිදිසියේම රෝගාතුරවූ කෙනෙකු ආ විට, ඉක්මණින් ප්‍රතිකාර කරමින්, බෙහෙත් ලබා දෙනවා. වෛද්‍යවරයෙකු නොමැති කඳුකර ගමට නිර්මාතෘ තුමාගේ සීයා නැතිවම බැරි පුද්ගලයෙක් වුනා.



# Director’s Column

## ධරණී වලින් ලැබුන පුදුම අත්දැකීම

**අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී**
**කෙයිචි අකගාවා මහතා**

නිචිකෝ නිවානෝ තුමාගේ මේ මස ධර්ම පණිවුඩයේ ධරණී පිලිබඳ පැහැදිලි කර දෙයි. ධරණී යනු ‘බුද්ධ ලෝකයට සෘජුව ඇතුළු විය හැකි ගුප්ත බලයක් ඇති වදනක්’ සේ දැනුන මගේ පෞද්ගලික අත්දැකීමක් පවසන්නම්.

අවුරුදු 18 කර පෙර, දැන් ජීවත්වන නිවසට පදිංචියට ගිය කාලයේ, ලඟම තිබුන හතරමං හන්දියේ බහුලව රිය අනතුරු සිදු වුනා. ඒ ප්‍රදේශය නිවාසත් ඉතා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ප්‍රධාන පාර නිසා එහාමෙහා යන වාහන ප්‍රමාණය වැඩි වුනත්, විදුලි සංඥා පුවරුත් තිබෙන, ඉතා පැහැදිලි හතරමං හන්දියකි. නමුත් නිතරම වාහන එකිනෙක හැප්පෙන විශාල හඬත්, අනතුරට පත්වුවන් රැගෙන යන්න පැමිණෙන ගිලන් රථයේ සයිරන් හඬත් ඇසෙන විට මුළු ශරීරයම සීතල වෙනවා.

ඒ දිනවල මගේ බිරිද විසින්, එහාමෙහා යන වාහන වල ආරක්ෂාව පතලා උදේ හා සවස කරන සූත්‍ර සජ්ඣායනයේදී ධරණීත් 10 වතාව බැගින් කිරිමට පටන් ගත්තා. ඇය දැනටත් එය නොකඩවා කරනවා. එසේ කිරීමට ආරම්භ කල දින පටන් අවුරුද්දක් ගත වෙන්නත් පෙර සිටම එක් අනතුරක්වත් සිදු නොවීම පුදුම සහගතයි.


ධරණී සජ්ඣායනය හා රිය අනතුරු සිදු නොවීම අතර කුමන ආකාරය සම්බන්ධතාවයක් තිබෙනවා දැයි නොදනිමි. නමුත්, ආරක්ෂිතව එදිනෙද ජීවිතය ගත කිරීම දැඩිව ප්‍රාර්ථනා කල මගේ බිරිදගේ සිතුවිල්ල තුලින් එම පුදුමය ඇතිකර තිබෙනවා වන්නට පුළුවන්.

ඒ හැමදෙයටම වඩා පුදුමය නම්, ධරණී සජ්ඣායනය තුලින් අපි දෙදෙනාගේ හදවත් ගැන අන්‍යෝන්‍ය වශයෙන් පසුවිපරම් කිරීමට හැකියාව ලැබීම නිසා, අපි දෙදෙනා අතර සිදුවන හැප්පීම්ද නතර වීමයි.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809, Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**